# එස්.එම්.ගේ ශිෂ්‍යත්ව වැඩසටහනට පැෆරල් විරෝධය

■ සාලිය කුමාර ගුණසේකර

මෙවර මහ මැතිවරණයට අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් තරග වදින අපේක්ෂක ඇමැති එස්. එම්. චන්ද්‍රසේන ශිෂ්‍යත්ව වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කර ඇති බවත්, එය නිදහස් හා සාධාරණ මැතිවරණයකට බලපෑමක් බවත් සඳහන් කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (පැෆරල්) සංවිධානය අනුරාධපුර මැතිවරණ පැමිණිලි නිරාකරණ ඒකකයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

"උසස් පෙළට අරුණැල්ල" යන නමින් සහ "දිරිමත්ව දිනවමු දරුවන්" මැයෙන් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇතැයිද එම පැමිණිල්ල මගින් සඳහන් කර තිබේ.